Australian Government
Department of Home Affairs

මෙම පිටුවෙහි

- ඔස්ට්රේලියානු ගමන් ප්රකාශනය
    - අරක්ෂාකාරී ගමන් කලාප
    - නවසීලන්තයේ අරක්ෂාකාරී ගමන් කලාප ගුවන් ගමන් සඳහා කෝවිඩ්-19 කොන්දේසි
    - ඔස්ට්රේලියාවට පැමිණීම
    - උපකාර

# ඔස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය

ඔබ ඔස්ට්‍රේලියාවට ගමන් කිරීමට පෙර, ඔබ ඔස්ට්‍රේලියාව වෙත පිටත්ව යාමට අවම වශයෙන් පැය 72 කට පෙර ඔස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනයක් සම්පූර්ණ කල යුතුය.

ඔස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය මගින් ඔබගේ ඔස්ට්‍රේලියාව තුල සම්බන්ධතා තොරතුරු, ගුවන් යානා තොරතුරු, නිරෝධායන අවශ්‍යතා සහ සෞඛ්‍යය තත්වය සම්බන්ධ තොරතුරු රැස් කර ගනු ඇත.

මෙම තොරතුරු ඔබගේ නිරෝධයන අවශ්‍යතාවයන් නිර්ණය කිරීමට (අවශ්‍ය නම්) ඔස්ට්‍රේලියානු රජයට උපකාර වන අතර ඔබ සමඟ ගමන් කරන යම් අයෙකු කෝවිඩ්-19 ආසාදිත වුණු අවස්ථාවක ඔබ හා සම්බන්ධවීමට අදාල සෞඛ්‍යය දෙපාර්තමේන්තුවටද උපකාරී වනු ඇත. ඔබ ප්‍රකාශනය සම්පූර්ණ නොකලේ නම්, ඔබට ගුවන් යානයට ගොඩවීමට නොහැකි විය හැකි අතර, ඔබ ඔස්ට්‍රේලියාව වෙත පැමිණීමෙන් අනතුරුව ප්‍රමාදයන් ඇතිවිය හැකිය.

ඔස්ට්රේලියානු ගමන් ප්රකාශනය ඔස්ට්රේලියාව තුලට ඇතුළුවන අය සඳහාය:

- ඔස්ට්රේලියානු පුරවැසියන් සහ ස්ථිර පදිංචිකරුවන්
- ගමන් සීමාවලින් ස්වයංක්රීයව නිදහස් වන අය
- දැනට ඇති ගමන් සීමාවලින් පුද්ගලිකව නිදහස් කිරීමක් ලබා දුන් අය.
- සංක්රාන්ති මගීන්.

ඔස්ට්රේලියානු ගමන් ප්රකාශනය සම්පූර්ණ කිරීමට අවශ්ය **නැති** ගමන් කරන අය අතර පහත අය ඇත:

- ගුවන් යානා කාර්ය මණ්ඩලය
- විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන්
- යුධ හමුදා ගුවන් යානාවල ගමන් කරන අය

ඔබ ප්‍රකාශනය ආරම්භ කිරීමට පෙර මෙම තොරතුරු සූදානම්ව තබා ගත යුතුය:

- ගමන් බලපත්‍ර විස්තර
- ගමනෙහි තොරතුරු
- ගමනාන්තය සම්බන්ධ තොරතුරු
- සම්බන්ධවීම සඳහා තොරතුරු.

ඔබ විසින් යාවත්කාලීන මයික්‍රොසොෆ්ට් එජ්, සෆාරි, ගූගල් ක්‍රෝම් හෝ ෆයර්ෆොක්ස් භාවිතා කල යුතුය. ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය ඉන්ටර්නෙට් එක්ස්පෝලර් හි ක්‍රියාත්මක වන්නේ නැත.

ඔබගේ වත්මන් සහ අනාගත ප්‍රකාශන එක් ස්ථානයක තබා ගැනීම සඳහා ඔබ විසින් ගිණුමක් විවෘත කල යුතුය. කෙසේ වුවද, ඔබ විසින් ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශය යොමු කිරීමෙන් අනතුරුව එහි ඇති පිළිතුරු යාවත්කාලීන කල නොහැක. ඔබ විසින් නව ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනයක් යොමුකර පරණ ප්‍රකාශනය මකා දැමිය යුතුය. මේවා අතර, ඔබගේ ගුවන් යානයේ, සෞඛ්‍යය තත්වයේ ඇති වෙනස්කම්, හෝ ඔබ ප්‍රකාශනයේ කිසියම් වරදක් කර ඇතිනම්, ඒවා ඇතුලත්වේ.

සෑම වැඩිහිටියෙකුම තම ප්‍රකාශනයක් සම්පූර්ණ කල යුතුය. කෙසේ වුවද, වයස අවුරුදු 15 කට අඩු දරුවෙකු වෙනුවෙන් මාපියන් විසින් ප්‍රකාශනයක් සම්පූර්ණ කල යුතුය.

ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනයක් සඳහා ඔබ විසින් ගෙවීමක් කිරීම අවශ්‍ය නැත - එයට ගාස්තුවක් නැත.

ඔබ විසින් ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය සම්පූර්ණ කල පසු, ඔබ ගුවන් යානයට ගොඩවීමට පෙර සහ ඕස්ට්‍රේලියාව වෙත පැමිණි පසු පෙන්වීම සඳහා (ඉලෙක්ට්‍රොනික හෝ මුද්‍රිත) ඔබට ඊමේල් පණිවුඩයක් ලැබෙනු ඇත.

ඔබට ලැබෙන ඊමේලයෙ ප්‍රතිඵලය පහත එකක් විය හැකිය:

- ඔබ පැමිණීමෙන් පසු නිරෝධායනය වීම අවශ්‍ය නැතිනම්, කොළ පැහැති ප්‍රතිචාරයක් (හරියක් සමඟ)
- ඔබ පැමිණීමෙන් පසු නිරෝධායනය වීම අවශ්‍ය නම්, නිල් පැහැති ප්‍රතිචාරයක් (අවර්ග්ලාසයක් -පැතැටියක්- සමඟ)
- ඔබ පහත දෙයක් ඇති බව හැඟවූයේ නම්, රතු පැහැති ප්‍රතිචාරයක් (කතිරයක් සමඟ):
    - කෝවිඩ්-19 ආකාරයේ රෝග ලක්ෂණ ඇති බව
    - කෝවිඩ්-19 ආකාරයේ රෝග ලක්ෂණ ඇති අයෙකු සමීපව සිටි බව:
    - නවසීලන්තයේ උනන්දුව දක්වන ස්ථානයක සිටි බව

    - ඕස්ට්රේලියාවට ගමන් කිරීම සඳහා කෝවිඩ්-19 නොමැති බවටවූ පරීක්ෂණයක් තිබීම අවශ්ය බව පිළි නොගැනීම
- **රතු ප්රතිචාර** සම්බන්ධයෙන් ඔබට ගමන් කල හැකිද යන්න ගුවන් යානා සමාගම විසින් තීරණය කරනු ඇත. ඔබට ඕස්ට්රේලියාවට පැමිණීමට හැකිනම්, පැමිණීමෙන් පසු නිරෝධායනය විය යුතුය.

**සටහන: ඕස්ට්රේලියානු රජය වෙත සාවද්ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ලබාදීම දරුණු අපරාධයකි. අපරාධයකට වැරදිකරු කළහොත්, උපරිම දඬුවම මාස 12 දක්වා සිර දඬුවමකි.**

දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඕස්ට්රේලියානු ගමන් ප්රකාශනය ලබා ගැනීම සඳහා තුන්වන පාර්ශවයකට අනුමැතිය ලබා දී ඇත. ඔබව මෙම පිටුවෙන් බාහිර ඕස්ට්රේලියානු ගමන් ප්රකාශන පිටුවකට නැවත යොමු කරනු ඇත.

ඔබගේ ප්රකාශනය යොමු කිරීමෙන් පසුව, ඔබට 'AU- Health Aero no-reply@health.aero' වෙතින් තහවුරු කරණ ඊමේල් පණිවුඩයක් ලැබෙනු ඇත.

මාර්ගගතව අයදුම් කරන්න

# අරක්ෂාකාරී ගමන් කලාප

ආරක්ෂාකාරී ගමන් කලාප යනු ගමන් කරන අය පසුගිය දින 14 ඇතුලත කෝවිඩ්-19 වසංගතය පැතිරී නොමැති ස්ථානයක සිටින අවස්ථාවල නිරෝධායනයෙන් තොරව ඕස්ට්‍රේලියාව වෙත පැමිණීම සඳහා වෙනත් රටක් සමග ඇතුල්වුණ ගිවිසුමකි. දැනට ඕස්ට්‍රේලියාව සමඟ ආරක්ෂාකාරී ගමන් කලාප ගිවිසුම් ඇත්තේ පහත රටවල් සමඟයඃ

- නවසීලන්තය.

# නවසීලන්තයේ අරක්ෂාකාරී ගමන් කලාප ගුවන් ගමන් සඳහා කෝවිඩ්-19 කොන්දේසි

දැනට නවසීලන්තයේ සිට පැමිණෙන (කොළ පැහැති කලාපය) නිරෝධායනයෙන් තොර ගුවන් යානා සම්බන්ධයෙන් දැනට කිසිදු කෝවිඩ්-19 කොන්දේසියන් නැත.

සියළුම සංචාරකයන් විසින් පිටත්වන ස්ථානයේ සහ අවසාන වශයෙන් පැමිණෙන ස්ථානයේ ඇති වැඩපිළිවෙලවල් සෝදිසි කල යුත්තේ නිරෝධායන අවශ්‍යතාවයන් තිබිය හැකිවීම හේතුවෙනි.

වැඩිදුර තොරතුරු සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව බලන්න: ජාත්‍යන්තර වශයෙන් ගමන් කරන අය සඳහා කොරෝනා වයිරස් (කෝවිඩ්-19) උපදෙස්.

# ඕස්ට්‍රේලියාවට පැමිණීම

ඕස්ට්‍රේලියානු ගුවන් තොටුපළවල කොළ සහ රතු කලාප ඇත්තේ පැමිණීමෙන් පසු නිරෝධායනය විය යුතු මගීන් හඳුනා ගන්නා බව සහතික කරනු සඳහාය.

ඔබ නිරෝධායනයෙන් තොර ගුවන් යානායක ගමන් ගත්තේ නම්, ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් පසු ගුවන් තොටුපලේ සියළු දේශසීමා නිශ්කාශන ක්‍රියාවලි සඳහා ඔබව කොළ කලාපය තුලින් යාමට මාර්ගෝපදේශය ලබා දෙනු ඇත.

කොළ සහ රතු ගමන් කලාප තුල සිට පැමිණෙන සියළු මගීන් හට වැඩි විස්තර සඳහා සෞඛ්‍යය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

# උපකාර

ATD පද්ධතිය සම්බන්ධයෙන් ඔබට ගැටළු ඇතිනම්, ඔබට මාර්ගෝපදේශය ලබා ගැනීම සඳහා පහත දේ උපයෝගී කර ගන්න.

## මට ATD ගිණුමක් විවෘත කල නොහැක

ඔබ ගිණුමක් විවෘත කිරීමට පෙර ඔබගේ ඊමේලය තහවුරු කර ගැනීම සඳහා.

'send verification code' මත ක්ලික් කර ඔබගේ ඊමේලය බලන්න. තහවුරු කර ගැනීමේ කේතය noreply@cps.com.au වෙතින් යවනු ඇත.

1 වන පියවර: තහවුරු කර ගැනීම සඳහවූ කේතය ඇතුලත් කර 'verify code' මත ක්ලික් කරන්න.

2 වන පියවර: ඔබගේ මුර වචනය ඇතුලත් කර, නම ප්‍රදර්ශනය කර 'create' මත ක්ලික් කරන්න.

තහවුරු කිරීමේ කේතය වලංගු වන්නේ ලැ**බීමෙන් පසු මිනිත්තු 4 ක් පමණි**.

ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය **මිනිත්තු 30 කාලයක් අක්‍රියව තිබීම හේතුවෙන්** කාලය ඉකුත්වේ.

## නිම නොකරන ලද ATD (ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනයක) සිට මාව ලොග් අවුට් කිරීම හෝ කාලය ඉකුත්වීම සිදුවී ඇත

අවසන් නොකරන ලද ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනයක් ඔබට සුරැකිය නොහැක.

ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය සම්පූර්ණ කිරීමට පෙර කාලය ඉකුත්ව ගියහොත්, නව ප්‍රකාශනයක් ආරම්භ කල යුතුය.

## මා හට ATD සම්පූර්ණ කිරීම හෝ යොමු කිරීම කල නොහැක.

ඔබ හට 1 වන පියවර පසුකර යා නොහැකි නම්, පහත දේ සෝදිසි කර බලන්න:

- ඔබ විසින් යාවත්කාලීන මයික්‍රොසොෆ්ට් එජ්, සෆාරි, ගූගල් ක්‍රෝම් හෝ ෆයර්ෆොක්ස් භාවිතා කල යුතුය. ඉන්ටර්නෙට් එක්ස්ප්ලෝරර් ක්‍රියා කරන්නේ නැත.
- ඔබගේ ගුවන් බලපත්‍ර අංකය ඇතුලත් කරන විට, ගමන් බලපත්‍ර අංක ක්ෂේත්‍රයෙන් අකුරු සහ අංක හැර සියළුම අක්ෂර ඉවත් කරන්න.
- යා ඉර (-) සහ ලොප් ලකුණ (‘) ආදී සියළුම විශේෂ අක්ෂර ඉවත් කරන බවට වග බලා ගන්න (පුද්ගලික තොරතුරු ක්ෂේත්‍රවල අකුරු සහ අංක පමණක් භාවිතා කරන්න).
- රතු තරු ලකුණකින් (*) සළකුණු කර ඇති සියළුම ක්ෂේත්‍ර සම්පූර්ණ කරන්න.

ඔබ හට 2 වන පියවර පසුකර යා නොහැකි නම්, පහත දේ සෝදිසි කර බලන්න:

- අවශ්‍ය සියළුම ක්ෂේත්‍ර සම්පූර්ණ කරන්න.  මේවා රතු තරු ලකුණකින් (*) සළකුණු කර ඇත.

ඔබ හට අවසාන පියවර පසුකර යා නොහැකි නම්, පහත දේ සෝදිසි කර බලන්න:

- ‘Important Notice’ සබඳියාව මත ක්ලික් කරන්න
- ඔබ කැමැත්ත ලබා දෙන්නේ නම්, ප්‍රකාශන කොටුව සළකුණු කරන්න.
- තිරයේ පහළ ඇති ‘Submit’ යන්න මත ක්ලික් කරන්න.

## ATD යොමු කිරීමෙන් පසු තහවුරු කිරීමේ ඊමේලයක් මා හට නොලැබිණි.

ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය සම්බන්ධ තහවුරු කිරීමේ ඊමේලය ලැබෙන්නේ AU-Health Aero (no-reply@health.aero) වෙතිනි.

ඔබට ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය සම්බන්ධ ප්‍රතිඵල ඊමේලය නොලැබුනේ නම්, ඔබගේ ජන්ක් හෝ ස්පෑම් ෆෝල්ඩරය බලන්න.

නිල් පැහැති තීන්දු නැති ආකාරයේ ඊමේලයක් ඔබ හට ලැබුණි නම්, ‘pending’ යනුවෙන් සඳහන් කර තව දුරටත් කටයුතු කිරීම අවශ්‍ය නැත යන්න දක්වා තිබුණද, මෙය ඔබට ලැබෙන අවසාන ප්‍රතිඵලයවේ. නිල් ප්‍රතිචාරය (පැතැටියක් සමඟ) මගින් අදහස් වන්නේ, ඔබ පැමිණි පසු නිරෝධායනය වීම අවශ්‍ය බවයි.

ඔබගේ ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශන ගිණුමට ඕනෑම අවස්ථාවක ලොග් වී ඔබගේ යොමු කිරීම සහ අයදුම්පතේ ප්‍රතිඵලය බලාගත හැකිය.

## ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය යොමු කිරීමෙන් පසු මා හට මාගේ ATD ගිණුමට ලොග් විය නොහැක.

ඕස්ට්‍රේලියානු ගමන් ප්‍රකාශනය වෙත ලොග් විය නොහැකි නම්, මුර වචනය ප්‍රතිස්ථාපනය කර ගත හැක.

- ‘forgot your password?’ මත ක්ලික් කරන්න (ලොග් ඉන් තිරයේ පහත ඇති මුරවචන ක්ෂේත්‍රය)
- අවශ්‍ය ක්ෂේත්‍රයේ ඊමේල් ලිපිනය ඇතුලත් කරන්න.
- ‘submit’ මත ක්ලික් කරන්න
- ඔබගේ මුරවචනය ප්‍රතිස්ථාපනය සම්බන්ධ සබැඳියාව සඳහා ඔබගේ ඊමේලය බලන්න
- ඔබගේ මුරවචනය ප්‍රතිස්ථාපනය කරන්න
- යොමු කල ගමන් ප්‍රකාශනය වෙත ලොග් ඉන් වන්න.

## ගුවන් යානය සම්බන්ධ නිවැරදි තොරතුරු ඇතුළු කරන්න.

ඕස්ට්‍රේලියාවට පැමිණෙන ගුවන් යානයේ තොරතුරු ඇතුලත් කරන්න. ඔබගේ ගමන වෙන් කරවා ගැනීම සනාථ කිරීමේ ලිපියේ මෙය සඳහන්වේ.

ගුවන් යානා අංක සම්බන්ධ නිවැරදි ආකාරය වන්නේ NZ103 (NZ0103 නොවේ), QF2 (QF002 නොවේ).

## ගමන් බලපත්‍රය හෝ වෙනත් තොරතුරු වැරදි ආකාරයට ඇතුලත් කර ඇත

ATD යොමු කිරීමෙන් පසු ATD වෙනස් කිරීමේ හැකියාවක් නැත. එක් එක ප්‍රකාශනය වලංගු වන්නේ ප්‍රකාශනයේ සඳහන් එක් අයෙකුගේ එක් ගුවන් යානයක් සඳහා පමණි.

ඔබ විසින් ATD යොමු කිරීමෙන් පසු, ඔබගේ ගමන් බලපත්‍ර අංකය වෙනස් කල නොහැක. ඔබගේ ATD ගිණුමෙන් දැනට ඇති ATD මකා දමා නව එකක් ආරම්භ කල යුතුය.

පුද්ගලික තොරතුරු හෝ ගමන් බලපත්‍රයේ කාලය ඉකුත් වන දින වැනි වෙනත් තොරතුරු වෙනස් කිරීම සඳහා ඔබ විසින් වෙනත් ඊමේල් ලිපිනයක් භාවිතා කර නව ATD ගිණුමක් ආරම්භ කර නව ATD එකක් යොමු කල යුතුය.

ගුවන් යානයේ විශේෂිත අවශ්‍යතාවයන් සපුරාලීමට යටත්ව, ඔබගේ තොරතුරු නිවැරදි කිරීම සඳහා නව ATD එකක් සම්පූර්ණ කල නොහැකිවීම මගින් ඔබට ගුවන් යානයට ගොඩවීම ප්‍රමාදවීම හෝ වැලැක්වීම සිදු නොවන බව කරුණාවෙන් සලකන්න.